මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2025.08.18

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

<u>ශ්‍රී ලංකා පොලිසිය සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම සහ අනෙකුත් ආයතනික ප්‍රතිසංස්කරණ</u>

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10(ඈ) වගන්තිය ප්‍රකාරව ජාතික නීති සහ 'පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වලට, නියමයන්ට සහ සම්මතවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම" සඳහා මෙම කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම ලිපිය ඔබ වෙත යොමු කරන්නෙමු.

ශ්‍රී ලංකා පොලිසිය යනු ශ්‍රී ලංකා දේශසීමාව තුළ නීතිය හා සාමය ඵලදායී ලෙස පවත්වාගෙන යාමට සහ මහජන ආරක්ෂාව සහතික කිරීම සඳහා බලය පැවරී ඇති ඉතා වැදගත් රාජ්‍ය ආයතනයක් බව කොමිෂන් සභාව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලිසිය සමග අඛණ්ඩව සම්බන්ධතා පවත්වමින් කටයුතු කර ඇති අතර, මෑතකදී ඔබ සමඟ ද ඵලදායී සංවාද පවත්වා ඇත. එවැනි ඵලදායී සංවාදයක ප්‍රතිඵලයක් ලෙස, කොමිෂන් සභාවේ මෑත කාලීන මාර්ගෝපදේශ සහ නිර්දේශ මත පදනම්ව ඔබ විසින් ප්‍රධාන අභ්‍යන්තර චක්‍රලේඛ කිහිපයක් නිකුත් කිරීමට කටයුතු කිරීම අගය කරන අතර, පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමග සිදුවන ගැටුමකදී සිදුවන පුද්ගල මරණ වැළැක්වීම, මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම සහ සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ නිර්දේශ ඒ තුළ ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෑතකදී ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සඳහා, වධහිංසා පැමිණවීම වැළැක්වීම සහ අත්අඩංගුවේ දී සිදුවන මරණ වැළැක්වීම සහ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම් වැනි ප්‍රධාන මානව හිමිකම් තේමාවන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමේ අධ්‍යාපන හා ධාරිතා සංවර්ධන වැඩසටහන් රාශියක් ද පවත්වා ඇත. මෙම වැඩසටහන් සඳහා නිලධාරීන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය ධනාත්මක වූ අතර, ප්‍රතිසංස්කරණ සඳහා සැබෑ ආයතනික කැමැත්ත ඔවුන් තුළින් දැක ගැනීමට ලැබීම කොමිෂන් සභාවේ සතුටට හේතුවන කරුණක් බව කිව යුතුය. මෙම වැඩසටහන් මගින් මෙම නිලධාරීන්ට තම අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාවක් ලබා දුන් අතර, එමඟින් කොමිෂන් සභාවට ඔවුන් මුහුණ දෙන ප්‍රායෝගික අභියෝග සහ පීඩන තත්ත්වයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලැබිණි.

එමෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එහි වධහිංසා වැළැක්වීමේ ජාතික යාන්ත්‍රණය (NPM) මගින්, පොලිස් ස්ථානවල මුහුණ දෙන පද්ධතිමය අභියෝග හඳුනා ගැනීමේ අරමුණින් සියලුම දිස්ත්‍රික්කවල පොලිස් ස්ථාන පරීක්ෂාව සිදු කරනු ලබයි. මෙම යාන්ත්‍රණයෙහි ප්‍රධාන කාර්යය වන්නේ අත්අඩංගුවේ පසුවන පුද්ගලයින්ට වධහිංසා පැමිණවීම හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත ලෙස සැලකීම වැළැක්වීම සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ලබා දීමයි.



ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙම පුළුල් වපසරිය තුළ, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා ඉදිරියේදී සම්බන්ධ කරගනිමින් ශ්‍රී ලංකා පොලිසියේ කටයුතුවලට සහාය ලබා දෙමින් සහ නීතියට අනුකූලව එකී රාජකාරි ඉටු කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

**අ. සම්පත් වෙන් කිරීම**

ශ්‍රී ලංකා පොලිසියට ප්‍රමාණවත් ලෙස අවශ්‍ය සම්පත් ලබා දීම, සියලු පුද්ගලයින්ගේ මානව හිමිකම්වලට ගරු කරමින්, ආරක්ෂා කරමින් සහ ප්‍රවර්ධනය කරමින් සිය රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමට හේතුවන තීරණාත්මක අංගයක් බව කොමිෂන් සභාවේ අදහසයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බොහෝ පොලිස් ස්ථාන සාමාන්‍යයෙන් සම්පත් හිඟභාවයකින් යුක්ත වන බවත්, ඒවායේ කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සම්පත් වෙන් කර දීමේ ප්‍රමාණවත් වැඩි වීමක් අවශ්‍යව ඇති බවත් නිරීක්ෂණය වේ. ශ්‍රී ලංකාව තුළ ආර්ථික අර්බුදයක් ඇති මෙවැනි සන්දර්භයක් තුළ මූල්‍ය විනය සහතික කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නා අතරම ශ්‍රී ලංකා පොලිසියට සම්පත් වෙන් කිරීම වැඩි කිරීම උපායමාර්ගික ආකාරයකින් සිදු කරන්නේ නම් එය මහජන මුදල් සඳහා කෙරෙන ප්‍රබල සහ යුක්ති සහගත ආයෝජනයක් වනු ඇතැයි කොමිෂන් සභාවේ විශ්වාසයයි.

ඒ අනුව නීතියට අනුකූලව තම රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, පොලිස් කොට්ඨාශ සහ පොලිස් ස්ථාන ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ සෑම මට්ටමකටම අවශ්‍ය වන්නා වූ මානව, භෞතික සහ තාක්ෂණික සම්පත් පිළිබඳ පුළුල් අවශ්‍යතා තක්සේරුවක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කොමිසම අදහස් කරයි. ඒ අනුව පහත සඳහන් සාධක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය:

අ. අවශ්‍ය යටිතල පහසුකම්, උපකරණ (පරිගණක සහ අනෙකුත් අවශ්‍ය උපාංග ඇතුළුව) සහ පහසුකම් ඇතුළුව පොලිස් ස්ථානවල සේවා තත්ත්වයන් වැඩිදියුණු කිරීම.

ආ. රැඳවුම් කුටිවල වාතාශ්‍රය අවශ්‍ය පරිදි ඇතුළු වන ලෙස වැඩි දියුණු කිරීම ඇතුළුව පොලිස් ස්ථානවල අත්අඩංගුවේ පසුවන පුද්ගලයින්ට අදාළ වන සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ සැකකරුවන් අත්අඩංගුවේ රඳවා තබා ගනිමින් ප්‍රශ්න කරන සියලුම ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා CCTV කැමරා ස්ථාපනය කිරීම.

ඇ. කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම, කාන්තා පොලිස් නිලධාරිනියන් වැඩි සංඛ්‍යාවක් සහ දෙමළ හා මුස්ලිම් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීම; සහ

ඇ. දෙමළ භාෂා නිපුණතාවයකින් යුතු හා පරිවර්තන කාර්යයන් සඳහා ප්‍රමාණවත් නිළධාරීන් පිරිසක් යොදා ගැනීම.

ඉ. මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම, ස්ත්‍රී පුරුෂ භාවයට ප්‍රතිචාර දැක්වීම, නව විමර්ශන ශිල්පීය ක්‍රම සහ තාක්ෂණය භාවිතා කිරීම, මූලික කුසලතා සංවර්ධනය සහ ප්‍රජා සහභාගීත්වය ඇතුළුව පුහුණු වැඩසටහන් සහ කුසලතා සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමට නියමිත මීළඟ වාර්ෂික අයවැයෙන් ශ්‍රී ලංකා පොලිසිය සඳහා අතිරේක සම්පත් වෙන් කිරීමට භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාව අදහස් කරයි.

මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකා පොලීසියට සම්පත් ප්‍රතිපාදන සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත යොමු කළ යුතු වෙනත් නිර්දේශයන් පිළිබඳව ඔබගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

### ආ. ඉලක්ක සහ දිරිදීමනාවන් සඳහා ව්‍යුහය

ඇතැම් දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පොලිස් ස්ථාන සහ පොලිස් කොට්ඨාශ භාර නිලධාරීන් කෙරෙහි ඇති කරගෙන ඇති වත්මන් අපේක්ෂාවන් පිළිබඳව කොමිෂන් සභාව වෙත තම ප්‍රසාදය පළ කර ඇත. එමෙන්ම පොලිස් කොට්ඨාශවල නීතිය හා සාමය පවත්වාගෙන යාමේ ප්‍රාථමික දර්ශකයක් ලෙස පොලිස් ස්ථාන විසින් සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව භාවිතා කිරීම කොමිෂන් සභාවේ දැඩි අවධානයට ලක් වී ඇත. මෙම පිළිවෙත මීට වසර කිහිපයකට පෙර හඳුන්වා දී ඇති බව පෙනී ගිය අතර, එය තවමත් ක්‍රියාත්මක වීම දක්නට ලැබේ. එවැනි ක්‍රියා පිළිවෙතක් දිගටම පැවතුනහොත්, එය අවිධිමත් සන්නිවේදනයක් ඔස්සේ කරන ලද අත්අඩංගුවට ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම උදෙසා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරීන් වෙත කෙරෙන විකෘති දිරිගැන්වීමක් වීමට ඉඩ ඇත. නිල සන්නිවේදනයන් තුළ එවැනි ඉලක්ක නිශ්චිතව දක්වා නොමැති වුවද, නිලධාරීන්ගේ උසස්වීම් තීරණය කිරීමේදී අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් කාර්ය සාධනය සලකා බලා කටයුතු කළ හැකි බව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

ශ්‍රී ලංකා පොලිසියට පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලිසිය සමග සිදුවන ගැටුමකදී සිදුවන මරණ වැළැක්වීම සඳහා 2025 අංක 1 දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශවල 1.2 වගන්තිය පිළිබඳ කොමිසම නැවත අවධාරණය කර සිටී. ඒ අනුව 'අත්අඩංගුවට ගැනීම් අත්තනෝමතික ආකාරයකින් සිදු නොකළ යුතුය හා පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමක් සිදු කරන සෑම පොලිස් නිලධාරියෙකුටම එහි අවශ්‍යතාවය සාධාරණීකරණය කිරීමට හැකි විය යුත්තේ එම පුද්ගලයා වරදක් කර ඇති බවට සාධාරණ සැකයක් මත සිදු කරන මූලික පොලිස් විමර්ශනයකින් පසුව විය යුතුය.

මෙම පසුබිම මූලික කොටගෙන, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත නිර්දේශ ඉදිරිපත් කරයි:

1. පොලිස් ස්ථානවල සහ පොලිස් කොට්ඨාශවල කාර්යක්ෂමතාව මැනීම සඳහා විධිමත් හා අවිධිමත් ලෙස ඉලක්ක ස්ථාපිත කර ඇති ආකාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ සියලුම ක්‍රියාපටිපාටීන් පුළුල් ලෙස සමාලෝචනය කිරීමට කටයුතු කිරීම. එමෙන්ම අවිධිමත් ලෙස පනවන ලද අත්අඩංගුවට ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා පොලිස් නිලධාරීන් වෙත බලපෑම් එල්ල නොකළ යුතු වීම.

2. පොලිස් නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම, පිළිගැනීම සහ උසස් කිරීම සඳහා (1) මෙහෙයුම් කාර්යක්ෂමතාව; (2) ප්‍රජා සහභාගීත්වය සහ විශ්වාසය (3) වෘත්තීය හැසිරීම සහ ආචාර ධර්ම (4) කුසලතා සහ නිපුණතා සංවර්ධනය (5) පරිපාලන කාර්යක්ෂමතාව වැනි ප්‍රමාණාත්මක මිනුම් සමඟ සම්බන්ධ කළ යුතුය. උදාහරණයක් ලෙස, මෙහෙයුම් කාර්යක්ෂමතාව සම්බන්ධයෙන්, ජාත්‍යන්තර උසස් ක්‍රියාපටිපාටීන්, පොලිස් නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම්, පිළිගැනීම සහ උසස් කිරීම තීරණය කළ යුතු ආකාරය පිළිබඳ ප්‍රයෝජනවත් මග පෙන්වීමක් ලබා දෙයි. ඒ අනුව අත්අඩංගුවට ගැනීමේ ඉලක්ක නොතකා ඒ වෙනුවට පහත සඳහන් මිනුම් සලකා බැලිය යුතුය:

අ. නඩු විසඳීමේ අනුපාතය; එනම් ලැබුණු පැමිණිලිවල ප්‍රතිශතයක් ලෙස විසඳන ලද නඩු ගණන

ආ. ප්‍රතිචාර දැක්වීමට ගත වන කාලය ; එනම් විශේෂයෙන් කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, වැඩිහිටියන් සහ සංක්‍රාන්තික සමාජභාවීය ප්‍රජාවේ පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වලින් හෝ ඒ සම්බන්ධයෙන් පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමට ගතවන කාලය

ඇ. අත්අඩංගුවට ගැනීම සිට දඬුවම් කිරීම දක්වා අනුපාතය; එනම් සාර්ථක නඩු පැවරීම්වලට තුඩු දෙන අත්අඩංගුවට ගැනීම්වල අනුපාතය සහ

ඈ. පොලිස් බල ප්‍රදේශවල අපරාධ අවම කිරීම.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඔබගේ අදහස් හා යෝජනා අපේක්ෂා කරන අතර, ඔබ විසින් ලබා දෙන අඛණ්ඩ සහයෝගයට ස්තූතිය පළ කර සිටිමු.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1) අතිගරු අනුර කුමාර දිසානායක මහතා,
ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති,
ආරක්ෂක අමාත්‍ය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

2) ගරු ආනන්ද විජේපාල මහතා,
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය,
18 වන මහළ,
සුහුරුපාය,
බත්තරමුල්ල.

3) ගරු හර්ෂණ නානායක්කාර මහතා,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය,
19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 01.